G.C.E. ORDINARY LEVEL

අ.පො.ස. සාමාන්‍ය පෙළ

STUDENT SEMINAR SERIES - 2017

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

SINHALA LANGUAGE & LITERATURE

සිංහල භාෂාව හා සාහිත්‍යය

QUESTION PAPER - I

ප්‍රශ්න පත්‍රය - I



Powered by

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

ePathshala The National e-learning Portal for The General Education

සා/පෙළ සිත්මිණ දැහැන් පෙළට නියහ වර්ම්

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉ-ඉගෙනුම් හා නැණසෙ අධ්‍යාපනික වැඩසටහන් ඒකකය

අ.පොෂ. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017

සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය

11 ශ්‍රේණිය	**සිංහල මාධ්‍යය**	**කාලය - පැ 1**

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- මෙම පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 40කි.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරින්** මුද්‍රිත කොටසෙහි අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

(01) පාලකයාගේ **කෙනෙහිලිකම්** හේතුවෙන් ආයතනය පිරිහීමකට ලක් වූ බව සේවකයෝ පවසති.

1. සිත් රිදවා හැසිරීම.
2. හිතවත්කම්
3. පිරිසකට පමණක් සැලකීම.
4. දැඩි සතුරුකම්

(02) ග්‍රාම නිලධාරිතුමා හමු වීමට ගිය සිරිවර්ධන **ආපසින් ම** ගෙදර පැමිණියේ ය.

1. ගිය විගස ම
2. පය ඉදිරියට තබා
3. සිතේ සතුටින්
4. හිතේ දුකෙන්

(03) අම්මා **වහෙන් ඔරෝවෙන්** කියූ දෙය අමාලිට නො තේරුණි.

1. සත්‍ය සඟවා
2. සත්‍ය ලෙස
3. වක්‍රව
4. සෘජු ලෙස

- අංක 05 සිට 07 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(04) ජල කළමනාකරණය සම්බන්ධ ක්‍රියාත්මක මට්ටමේ පවතින ව්‍යාපෘතියක් ලෙස පුරාණ වැව් .....කිරීම දැක්විය හැකි ය.

1. නිර්මාණය
2. ප්‍රතිසංස්කරණය
3. සුරක්ෂිත
4. වාෂ්පීකරණය

(05) පාඨකයා සාහිත්‍ය නිර්මාණයක් ..... කරනුයේ තමන් මීට පෙර අත් නොවිඳි අන්දමේ අත්දැකීමක් විඳ ගැනීමට ය.

1. සංරක්ෂණය
2. පරිවර්තනය
3. පරිශීලනය
4. පරිරක්ෂණය

(06) නාට්‍ය අධ්‍යක්ෂවරයා නාට්‍ය නිෂ්පාදනය කිරීමට උපයෝගී කර ගන්නේ රචකයා ..... පිළියෙල කළ නාට්‍ය පිටපත යි.

1. විධිමත්ව
2. රසවත්ව
3. සංවරව
4. සංක්ෂිප්තව

(07) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව පඳ ගැළපූ වරණය තෝරන්න.

1. එංගලන්තය , ඇමරිකාව , බ්‍රිතාන්‍යය , කෙන්යාව
2. ආර්ජන්ටිනාව , සුඩානය , සිරියාව , සෝමාලියාව
3. ඕස්ට්‍රේලියාව , කැනඩාව , යේමනය , හංගේරියාව
4. උගන්ඩාව , ඔස්ට්‍රියාව , ජපානය , චීනය

(08) සඤ්ඤක අක්ෂර හඳුන්වන වෙනත් නමක් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. අනුනාසික අක්ෂර ය.
2. වර්ගාන්ත අක්ෂර ය.
3. නාසික්‍ය අක්ෂර ය.
4. අර්ධානුනාසික්‍ය අක්ෂර ය.

(09) ච, ඡ, ජ, ඣ, ඤ අක්ෂර අයත් වර්ගය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. කණ්ඨජ ය.
2. තාලුජ ය.
3. මූර්ධජ ය.
4. දන්තජ ය.

(10) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. දෘෂ්ටි , උච්චාරණය , දීර්ඝ , කැලණි
2. මර්දනය , අනර්ඝ , කුෂ්ට , මාර්ගස්ථ
3. ව්‍යඤ්ජන , ප්‍රාසංගික , තුෂ්ටි , වළාකුල
4. දෘශ්‍යාධාර , ඵෙක්‍යය, සම්ප්‍රදාන, ඖෂධ

(11) සෑම වාක්‍යයක ම අක්ෂර වින්‍යාසය දෝෂ දෙකකට **වැඩියෙන්** යෙදුණු වාක්‍ය තෝරන්න.
1. විද්‍යාත්මක හා ශාස්ත්‍රීය ලේඛණයක දී ඉස්මතු වන්නේ කරුණු, තොරතුරු හා සාධක ය.
2. වර්ථමාන පාඨකයෝ දැණුම සඳහා ද චින්දනය සඳහා ද කියවති.
3. වාක්‍ය රීති අනුගමනය කිරීමෙන් ප්‍රශස්ත ලෙස භාෂාව භාවිත කිරීම සන්නිවේදන කාර්යයේ දී වැදගත් වේ.
4. වගා ලිංවලින් ඉවත් කල පස් , භූ විද්‍යාඥයින් විසින් පරීක්ෂාවට ලක් කෙරිනි.

(12) හුරු , නැව , ව්‍යන , හෘදය
මෙහි ඉරි ඇඳි පදවල යෙදී ඇති පිල්ලම් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
1. ඇඳපිල්ල , පාපිල්ල , ගැටපිල්ල , ගයනුකිත්ත
2. පාපිල්ල , ඇලපිල්ල, ගයනුකිත්ත , ගැටපිල්ල
3. පාපිල්ල , ඇඳපිල්ල , ගැටපිල්ල , ගයනුකිත්ත
4. පාපිල්ල , ඇඳපිල්ල, ගයනුකිත්ත , ගැටපිල්ල

(13) ගෙය , කන්ද , මහල්ලෝ , සිංහයා යන පදවල ප්‍රකෘතිය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ගෙ , කන්ද , මහල්ල , සිංහයා
2. ගෙය , කඳු , මහලු , සිංහ
3. ගෙය , කඳු , මහලු , සිංහයා
4. ගෙ , කඳු , මහලු , සිංහ

(14) ප්‍රත්‍යයාර්ථ නාමයක් **නොයෙදුණු** වාක්‍ය තෝරන්න.
1. සාහිත්‍ය විචාරක කාර්යයයේ දී විචාරාත්මක බස් වහර පරිහරණය කිරීම අත්‍යවශ්‍ය වේ.
2. ප්‍රකෘති අලංකාරයේ මධ්‍යස්ථානය වූ නෙල්ලි කැලේ මගේ රාජ්‍යයට අයත් උද්‍යානයකි.
3. ඉපැරණි චාරිත්‍රවලින් සමන්විත දළදා පෙරහැර ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිඹිබු කරන උත්සවයක් ලෙස සැලකෙයි.
4. නිර්මාණකරුවා ඇසුරු කරන සමාජයෙන් ද අත්දැකීම් ලබා ගනියි.

(15) බහුවචන අනුක්ත පද පමණක් යෙදී **ඇති** පිළිතුර තෝරන්න.
1. මිනිසුන් , ඈ , සිංහයන් , වෙළෙන්දෝ
2. ගුරුවරුන් , භික්ෂූන් , ගැහැනියක , ඔවුන්
3. දරුවන් , සතුන් , ව්‍යාපාරිකයන් , සෙස්සන්
4. සේවකයන් , බමුණෝ , කාන්තාවන් , දාසයන්

(16) උපසර්ග පදයක් යෙදී **නැති** පිළිතුර තෝරන්න.
1. මැටි කාර්මිකයා සොබාදහම සමග ඉතා සමීප දිවියක් ගත කළේ ය.
2. කවීනු විවිධ ශිල්පීය උපක්‍රම භාවිත කරමින් සාරවත් නිර්මාණ ඉදිරිපත් කිරීමට වෙහෙසෙති.
3. අතිවිශාල ලාභ ලැබූ ප්‍රබල සමාගම්වලට රාජ්‍ය නායකයන් හැසිරවීමට පවා හැකි විය.
4. බලශක්ති උත්පාදනයට අද ජලය භාවිත කෙරෙයි.

(17) මුලින් දී ඇති පදයට **සමානාර්ථවත්** පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
1. උදක - ජලය , දිය , අඹ , දිල
2. අනංගයා - මල්සර , මලවි , පන්සිළු , මින්දද
3. උද්දීපන - හැඟීම් දනවන , තියුණු කරන , ප්‍රබෝධ කරන , අනුරාගය ඇති කරන
4. විරන්තන - පුරාතන , පැරණි , ආදි , නූතන

(18) මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථවත්** පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
1. වර්ධනය - සංවර්ධනය , අභිවර්ධනය , දියුණුව , ප්‍රගමනය
2. උත්කෘෂ්ට - අධම , උසස් , අදීන , විශිෂ්ට
3. කෘතවේදී - සංවේදී , කෘතඥ , ගුණවන්ත , ගුණෝපේත
4. අනල්ප - ස්වල්ප , සුඟ , කුඩා , ටික

(19) පද දෙකෙහි ම අර්ථයක් නොමැති යුගල පද යෙදී ඇති වරණය තෝරන්න.
1. වං හුං , තක්කු මුක්කු , තාන්න මාන්න , අබල් බබල්
2. පඩි නඩි , වත ගොත , අලි ඇත්තු , නහින දෙහින
3. සණ්ඩු සරුවල් , වත් පොහොසත් , ලොක්කො බක්කො , ඉඳුම් හිටුම්
4. දරු මල්ලෝ , තෑගි බෝග , බත බුලත , ගල් මුල්

(20) පහත දැක්වෙන පද යොදා වාක්‍ය සකස් කිරීමේ දී නිවැරදි පිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සිය තරුණ වියේ දී විලියම් ශේක්ස්පියර්ට අවශ්‍ය ..... විවේකය තිබෙන්නට ඇත.
2. රාජ සභාවල දී විලියම් ශේක්ස්පියර්ගේ නාට්‍යවල විශේෂ දර්ශන ..... රංගගත කරන ලද්දේ ය.
3. ශේක්ස්පියර්ගේ ජීවිතය ..... පරිපූර්ණ සටහනක් ඉදිරිපත් කිරීම අපහසු ය.
4. ශේක්ස්පියර්ගේ කවියක් නාට්‍යයක් ගැන හැඳින්වීමක් කිරීම ..... අසීරු ය.

A - නිතර **B – ඉතා** **C- පිළිබඳ** **D - තරම්**

1. DBAC
2. DABC
3. DCAB
4. DACB

(21) නිපාත පද **දෙකක්** පමණක් යෙදුණු වාක්‍යය තෝරන්න.

1. වර්තමානයේ දළඳා පෙරහැර නර්තනාංග රැසකින් සමන්විත ය.
2. ඈ සුරඟනක මෙන් සුන්දර කාන්තාවක් වූවා ය.
3. රචනා ලිවීම ලේඛන කුසලතා වර්ධනයට ඉවහල් වන ක්‍රියාකාරකමකි.
4. සාහිත්‍යකරුවා තමා අත්දුටු දෙය ඒ ආකාරයෙන් ඉදිරිපත් නො කරයි.

(22) මුලින් දී ඇති පදයට **බහ්වර්ථවත්** පද පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. සල - අවල , ශාලාව , ගල , චංචල
2. තුරු - තෙක් , අතුරු , ගස් , තාරකා
3. දද - කුෂ්ඨය , කොඩිය , බමුණා , පක්ෂියා
4. සර - විල , කාන්තාව , නාදය , වර්ණය

(23) පහත සඳහන් පැදියේ රූපකාර්ථවත් යෙදුම ඇතුළත් වරණය තෝරන්න.

සුර බිලිඳෝ සඳ කැලුම්
තළත සමන් මල් නොහිම්
බිහිරි වෙනි යි කන සියුම්
නවතනි දී අත් කුසුම්

1. සමන් මල්
2. කන සියුම්
3. අත් කුසුම්
4. සඳ කැලුම්

(24) පහත දී ඇති පද්‍ය පාදවල උපමාවක් යෙදී **නැති** පිළිතුර තෝරන්න.

1. පහන් බැවින් පිටතට සස ලෙසින් වත
2. නුබ සා මඩුලු සඳ වෙලෙන ළපලු පැහැපත
3. සුරපුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ
4. බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන වට

(25) විභක්ති සමාසයට නිදසුනක් වන පිළිතුර තෝරන්න.
1. මුහුදු සුළං
2. අපිරිසිදු
3. මලවි
4. ප්‍රතිසංස්කරණය

(26) 1 බාලිකාවෝ උදෑසන ම පාසලට යති.
2 රියදුරු විසින් බසය පදවනු ලබයි.
3 රජු කෙරෙහි තේජස පවතී.
4 අපි පොතපතින් උගනිමු.

උක්ත අංකිත පද පිළිවෙළින් ගැළපූ විට නිවැරදි විභක්ති පද වර්ගය සහිත වරණය වනුයේ,

1. කර්තෘ , ආධාර , ප්‍රථමා , කරණ විභක්තිය වේ.
2. ප්‍රථමා , ආධාර , කර්තෘ , කරණ විභක්තිය වේ.
3. ප්‍රථමා , කර්තෘ , ආධාර , කරණ විභක්තිය වේ.
4. ප්‍රථමා , කරණ , ආධාර , කර්තෘ විභක්තිය වේ.

(27) පහත (අ) කොටසේ දැක්වෙන සන්ධි පදය සමග (ආ) කොටසට අයත් සන්ධි නාමය අනුපිළිවෙළින් ගැළපෙන වරණය තෝරන්න.

(අ)	(ආ)
1 මුදලිඳු	E පූර්වස්වර ලෝප සන්ධිය
2 දුරින්	F ස්වරාදේශ සන්ධිය
3 දෑවර	G පරස්වර ලෝප සන්ධිය
4 රුවනාර	H ස්වර සන්ධිය

1. G F E H 2. G H F E 3. G E F H 4. G E H F

(28) **කළු අකුරින් මුද්‍රිත** පද අයත් ක්‍රියා වර්ගය නිවැරදිව යෙදෙන වර්ණය තෝරන්න.

★ **කියමින්** ගී රස මියුරු
★ **කියත** උන් මෙතෙපල
★ හිතේ දුකට නිදි නැතුවා **කියාපන්**
★ බුද්ධිය උඹ තමයි එදා පාර **කියා** දුන්නේ

1. මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , විධි ක්‍රියා , පූර්ව ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , විධි ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා

(29) "මාමේ, දේශගුණික ආපදාවලට උදාහරණ විදිහට නියඟ , ජල ගැලීම් එහෙම කියන්න පුළුවන් නේද?" මෙම වාක්‍යයේ ඇතුළත් වී **නොමැති** විරාම ලක්ෂණය තෝරන්න.

1. යුගල උඩු කොමාව
2. ප්‍රශ්නාර්ථ ලකුණ
3. තනි උඩු කොමාව
4. නැවතීමේ ලකුණ

(30) නිවැරදිව ගැළපෙන වරණය තෝරන්න.

A දියදොස්	E තොණ්ඩුව
B මී හරකා	F කුඩහලුවා
C මුදුන	G පැණි කොමඩු
D පිරිමි ළමයා	H ඇම්බරයා

1. A H 2. B F 3. D G 4. C E

(31) "..... සුරු නර විරු කැල
යළි හෙළ බිම ඉපදේවා " මෙහි හිස්තැනට යෙදෙන කවි පදය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. බුජ පළ බල කළ
2. බුජ බල කළ පළ
3. බුජ කළ පළ බල
4. බුජ බල පළ කළ

- වැරදි අදහස ඇති වාක්‍යය තෝරන්න.

(32) 1. ඌෂ්මාක්ෂර ඝර්ෂ නමින් ද හැඳින්වේ.
2. පාලි සංස්කෘත භාෂාවලින් සිංහල භාෂාවට පැමිණ ඇති තත්සම වචනවල 'ෆ' අක්ෂරය යෙදේ.
3. මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන දෘෂ්ටිගෝචර සංකේත අක්ෂර නම් වේ.
4. ලේඛනය යනු භාෂණය හෙවත් කථනය දෘශ්‍ය රූප බවට පත් කිරීමේ මාර්ගය යි.

(33) 1. කර්ම කාරකයට හැරවිය හැක්කේ සකර්මක ක්‍රියා පදයක් ඇති වාක්‍ය පමණි.
2. නිශ්චිතව කර්තෘ ප්‍රකාශ කළ නොහැකි අවස්ථාවල දී බොහෝ විට කර්මකාරක යෙදුම් දැකිය හැකි ය.
3. උපමාවාචී නිපාතයකට පූර්වයේ යෙදෙන්නේ උක්ත නාම පදයකි.
4. ඝෝෂ අක්ෂරයට පෙරටුව යෙදෙන විට 'ත් ' යන්න අනුරූප ඝෝෂ ශබ්දය වන 'ද් ' බවට පත් වේ.

- උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදිව යෙදී **ඇති** වාක්‍යය තෝරන්න.

(34) 1. වෘත්තීය සමිති නායකයෝ කිහිප දෙනෙක් සාකච්ඡාව මෙහෙයවූහ.
2. වෘත්තීය සමිති නායකයන් කිහිප දෙනෙක් සාකච්ඡාව මෙහෙයවූහ.
3. වෘත්තීය සමිති නායකයන් කිහිප දෙනෙකු සාකච්ඡාව මෙහෙයවයි.
4. වෘත්තීය සමිති නායකයෝ කිහිප දෙනෙකු සාකච්ඡාව මෙහෙයවූහ.

(35) 1. ප්‍රදේශවාසීහු ඩෙංගු රෝග මර්දනයට සහාය නො දෙති'යි නිලධාරීහු පවසති.
2. ප්‍රදේශවාසීන් ඩෙංගු රෝග මර්දනයට සහාය නොදෙන්නේ' යි නිලධාරීහු පවසති.
3. ප්‍රදේශවාසීහු ඩෙංගු රෝග මර්දනයට සහාය නො දෙන්නේ' යි නිලධාරීහු පවසයි.
4. ප්‍රදේශවාසීන් ඩෙංගු රෝග මර්දනයට සහාය නො දෙති' යි නිලධාරීහු පවසති.

(36) 1. බිඟු කැල තඹරු පෙති මත රැඳී සිටී.
2. තුරු පෙළ අපූරු අලංකාරයක් මවති.
3. මල් පොකුර නෙත් සිත් ඇද ගත්තෝ ය.
4. ළමා රංචුව ක්‍රීඩා පිටිය දෙවනත් කරති.

- පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

(37) <u>වඳුරන් ගෙවල් හදනවා වාගෙයි.</u>
1. සාකච්ඡාවෙන් පසු ගෙවල් සෑදීම.
2. ගස් අතු මත ගෙවල් සෑදීම.
3. සාකච්ඡාව මිස වැඩක් නොකර සිටීම.
4. ප්‍රයෝජනයට ගත නොහැකි ගෙයක් සෑදීම.

(38) <u>ලිබ්බොක්කේ ලැග්ග බළලා වාගෙයි.</u>
1. අලසකමින් සිටීම
2. ලිබ්බොක්කේ පදිංචි වී සිටීම
3. උණුසුම සොයා යාම
4. කුස්සියෙන් එළියට නොයාම

(39) 'සේවකයෝ ටිකක් වැඩට ඇවිල්ලා' මෙය ලිඛිත ව්‍යවහාරයෙන් දැක්වූ විට නිවැරදි පිළිතුර තෝරන්න.
1. සේවකයෝ කිහිප දෙනෙක් වැඩට පැමිණ ඇත
2. සේවකයන් කිහිප දෙනෙක් වැඩට පැමිණ ඇත
3. සේවකයෝ කිහිප දෙනෙකු වැඩට පැමිණ ඇත
4. සේවකයින් කිහිප දෙනෙකු වැඩට පැමිණ ඇත

- පහත දී ඇති ගද්‍ය කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(40) සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම පාඨකයාට විඳිනයක් ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය.

1. පාඨකයාට විඳිනයක් ඇති වන ආකාරයෙන් අර්ථවත්ව අත්දැකීම් ඉදිරිපත් කිරීම සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි කරන්නකි.
2. සාහිත්‍යකරුවාගේ කාර්යභාරය වන්නේ අර්ථවත් නිර්මාණයක් නැවත ඉදිරිපත් කිරීමයි.
3. අර්ථවත් අත්දැකීමක් යොදා නැවත පාඨකයාට විඳිනයක් ලබා දීමෙන් සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.
4. අත්දැකීමක් තෝරා ගැනීමත් එය නැවත ඉදිරිපත් කිරීමත් නිසා සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය අර්ථවත් වේ.

ඉන්ටනෙට් සෙල්ලං

දිනක වේදෝ ලෙල්ලන්



නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න

Dialog

තිරසාරත්ව අංශයේ පණිවිඩයකි

G.C.E. ORDINARY LEVEL

අ.පො.ස. සාමාන්‍ය පෙළ

STUDENT SEMINAR SERIES - 2017

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

SINHALA LANGUAGE & LITERATURE

සිංහල භාෂාව හා සාහිත්‍යය

QUESTION PAPER - II

ප්‍රශ්න පත්‍රය - II



Powered by

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e පාඩම™ The National e-learning Portal for The General Education

සා/පෙළ සිත්මිණ

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉ-ඉගෙනුම් හා නැණසැස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය
අ.පොෂ.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017

සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය

11 ශ්‍රේණිය	සිංහල මාධ්‍යය	කාලය - පැ 2

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*
- *මෙම පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 80 කි.*

01) (i) සිට (x) දක්වා ඇති <u>සියලු</u> <u>ම</u> අනුකොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර <u>නොලියන්නේ</u> නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) 'ත ථ ද ධ න' යන අක්ෂර වර්ගය හැඳින්වෙන නම ලියන්න.

(ආ) ''ප්‍රවේණි'' යන වචනයෙහි ස්වර හා ව්‍යංජන වෙන් කර දක්වන්න.

(ii) (අ) පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍යය කර්ම කාරකයට හරවන්න.

ඔවුහු අප ඇමතූහ.

(ආ) පහත දැක්වෙන වාක්‍යය කර්තෘ කාරකයට හරවන්න.

විද්‍යාඥයන් විසින් පිට සක්වළ ජීවීහු නිරීක්ෂණය කරනු ලබති.

(iii) පහත දැක්වෙන වාක්‍ය දෙකෙහි අක්ෂර වින්‍යාසය සදොස් වචනය බැගින් යෙදී ඇත. එම වචන දෙක පමණක් නිවැරදි කරන්න.

(අ) දියේ ගිලී ගොඩට ගනු ලැබූ කාන්තාව කෘතිම ශ්වසනය ලැබීමෙන් පසු කතා කළා ය.

(ආ) අලංකාර පක්ෂියකු වන මොණරා දඩයක්කරුවන්ගෙන් රැක ගත යුතු ය.

(iv) මෙම වාක්‍යය සදොස් නම් නිදොස් කර ලියන්න.

(අ) කලක් ජනප්‍රිය නිළියක් ව සිටි ඕ තොමෝ අද ඕස්ට්‍රේලියාවේ වාසය කරයි.

(ආ) වත්මන් කවීහු පුරාතන සාහිත්‍යය පරිශීලනය නොකරති'යි විචාරකයෝ පවසති.

(v) පහත දැක්වෙන කාව්‍ය ඛණ්ඩයේ ඉරි ඇඳි පද කවර ක්‍රියා වර්ගයකට අයත් දැයි ලියන්න.

මූණ රවා ගෙන <u>ගොස්</u> ගෙට වැදිලා
පූන නුල ඇද <u>දමමින්</u> බිඳලා

(vi) පහත දැක්වෙන අදහස් කියැවෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.

(අ) ඉතා ම කලාතුරකින් උදා වන දුර්ලභ අවස්ථාවක්

(ආ) දුන් දඬුවමට දක්වන ව්‍යාජ විරෝධය

(vii) එකිනෙක පද අනුරූප වන සේ පහත දැක්වෙන පද යුගල සකස් කරන්න.

(අ) සඳ මණ්ඩලය (ආ) පරිත්‍රාණ දේශනය

(viii) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදයක් සහ කෘදන්ත පදයක් උපුටා ලියන්න.

ඔහු කියූ වචනයට තොටියා සිය නොරුස්නා බව පෙන්වී ය.

(ix) පහත දැක්වෙන ප්‍රාදේශික සහ පරිමිත භාෂා ව්‍යවහාරයන් සඳහා පොදු ව්‍යවහාර දක්වන්න.

(අ) බක්කා (ආ) මාරියාව

(x) පහත දැක්වෙන පද විසන්ධි කර සන්ධි විධිය ද දක්වන්න.

(අ) වියවුල් (ආ) මිහින්තලා (ලකුණු 2 x 10 = 20 යි.)

02) පහත දැක්වෙන අ, ආ,ඉ,ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 ට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- අන්තර් ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදා ගත හැකි මාතෘකාව ආදිය පිළිබඳ මඟ පෙන්වීමක් අදාළ විස්තර ඇසුරින් ලබා ගන්න.

(අ) අපේ රටේ දිනපතා ම සිදු වන මාර්ග අනතුරු බොහෝ ය. මේ නිසා වටිනා ජීවිත මෙන් ම දේපළ ද රටට අහිමි වෙයි. මාර්ග අනතුරු සඳහා බලපාන හේතු සාධක හඳුනා ගෙන ඒවා අවම කර ගැනීමට කටයුතු කිරීම කාගේත් වගකීමකි.

(ආ) පෙරදිග ධාන්‍යාගාරය නම් වූ අපේ මවුබිමේ බොහෝ කුඹුරු අද පුරන් වී ගොසිනි. ගොවි පුත්තු තම උරුමයෙන් හිමි වූ කුඹුරු ඉඩම් හැර දමා නගරවලට සංක්‍රමණය වෙති. එසේ වන්නට බොහෝ හේතු බලපා තිබේ. මේ ගැන අවධානය යොමු කොට ගොවිතැන ද, ගොවි ජීවිතය ද නගා සිටුවීම රටේ ආර්ථිකයට ද වැඩ දායක ය.

(ඉ) ජන මාධ්‍යය ඉතා දියුණුවට පත් වී ඇති නමුදු, මෙරට සමාජ පරිහානියට ද මාධ්‍යය වගකිව යුතු යැයි අදහස් පළ වේ. මේ ගැන අවධානය යොමු කරමින් රටේ සංස්කෘතිය සදාචාරය හා සංවර්ධනය

සඳහා විද්‍යුත් මාධ්‍යය මෙන් ම මුද්‍රිත මාධ්‍යය ද වගකීමෙන් කටයුතු කළ යුතු ය.

(ඊ) ආත්මාර්ථයෙන් බැහැර වූ සංවේදී, බුද්ධිමත් හා යහපත් ආකල්ප සහිත සමාජයක් ගොඩනැගීමට කියැවීමෙන් ලැබෙන බලපෑම ඉමහත් ය. පාඩම් පොත්වලට ම සීමා නොවී බාහිර පොත්පත් කියවීමෙන් ලබන චරිත සංවර්ධනය සමාජ සංවර්ධනයට ද ඉවහල් වේ.

03) පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න.ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

විද්‍යා පුනර්ජීවනයෙන් සහ කාර්මික විප්ලවයෙන් හිස උදුම්මා ගෙන ආසියාතික රටවලට පැමිණි බටහිර ජාතීන්ට මේ රටවල තිබූ පැරණි ජාතික සංස්කෘතිය සහ සභ්‍යත්වයත් තියුණු ලෙස වටහා ගැනීමට ශක්තියක් ඇති නොවී ය. මේ රටවල තිබූ සෑම ආගමක් දෙස ම ඔවුන් බැලුවේ සාවඥ ඇසිනි. ආධ්‍යාත්මික අංශයෙන් ඉතා ඉහළට නැගී සිටි ප්‍රාචීන ශිෂ්ටාචාරයෝ භෞතික අංශයෙන් උසස් නොවූ හෙයින් ම ඔවුන්ගේ සිනහවට ලක් වූහ. විසිවන සියවසේ පරමාණු යුගයේ දී වුව ද බුදු දහම පවා බටහිර

කීප දෙනෙකුට හැරෙන්නට ඔවුන් බොහෝ දෙනෙකුට පෙනුණේ මිලේච්ඡ ධර්මයක් ලෙස ය. පොතපත මගින් යටත් ජාතිකයන්ට, තමන්ගේ ජාතික ආගම්වලට,කලාවන්ට ගැරහීමට ඔවුහු උගැන්වූහ. විදේශික බලය තහවුරු කිරීමට, ගත හැකි වූ ඉතා සූක්ෂ්ම පියවර ඒ ඒ රටවල වැසියන් කෙරෙහි තම ජාතිය පිළිබඳව ඇති ජාතිකානුරාගය වැනසීම බව සිතූ ඔවුහු ඒ ඒ රටවල ජාතික වීරයන් හොර තක්කඩින් ලෙස හුවා දැක්වූහ. ඔවුන් ලවා බටහිරට ආ වැඩීමට උගන්වා, මානසික වහල් භාවයක් එම ජනයා තුළ ඇති කිරීමට ද කටයුතු කළහ.

(ලකුණු 10)

04) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කල්පනාකාරී සාමාන්‍ය මිනිසුන් තුළ හට ගන්නා මේ හැඟීම්වලට හාත්පසින් ම වෙනස් වූ ස්වභාවයක් නවීන විද්‍යාවෙන් දැක්වෙන්නේ ය. කෝටි සංඛ්‍යාත මනුෂ්‍යයන් විනාශ කරමින් පැවතුණ බිහිසුණු රෝග නවීන විද්‍යාත්මක ඖෂධවලින් දැන් පරාජය කෙරෙන්නේ ය. වේගවත් ගගන යාත්‍රාවන්ගෙන් දුර කතර නැති කෙරෙන්නේ ය. විදුලි බලයෙන් විස්මයජනක සැප පහසුකම් මනුෂ්‍යයන්ට අත් කර දෙන්නේ ය. මිනිසුන්ට වුවමනා සෑම දෙයක් ම ක්ෂණයකින් නිෂ්පාදනය කිරීමට බලය ඇති කර්මාන්තාගාර ඇති වන්නේ ය. උණ සන්නිපාතය, වසූරිය, කොලරාව ආදි බිහිසුණු වසංගත රෝග ශිෂ්ට සමාජයෙන් අතුරුදහන් වන්නේ ය. ශ්‍රී සමෘද්ධියක් සහිත අනාගතයකට මනුෂ්‍යයා ළඟා වෙමින් සිටින බව බොහෝ දෙනෙක් විශ්වාස කරති. එහෙත් මේ සමෘද්ධිමත් අනාගතයේ සැප සම්පත් භුක්ති විඳීමට මනුෂ්‍ය වර්ගයා ඉතිරි වෙති'යි කාට නම් කිව හැකි ද? පරමාණු බෝම්බයත්, ඊටත් වඩා විනාශදායක ආයුධත් ඒ ඒ බලසම්පන්න රටවල ආණ්ඩුවල මෙහෙවීමෙන් ම නිර්මාණය වෙමින් පවත්නේ ය.

(i) අනාගත ශ්‍රී සම්පත්තිය විඳීමට මනුෂ්‍යයාට නොහැකි වෙති'යි තර්ක කළ හැක්කේ කෙසේ ද?

(ii) සමාජයෙන් අතුරුදන් වී යන රෝග දෙක නම් කරන්න.

(iii) ඒ ඒ ස්ථාන අතර දුර කතර නැති වනුයේ කෙසේ ද?

(iv) මිනිසාට සැප පහසුකම් ලැබෙන මාර්ගයක් නම් කරන්න.

(v) විද්‍යාත්මක, සමෘද්ධිමත් යන වචනවල අර්ථ ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

05) සමන්පුර 'විකසිත' යෞවන සමාජයේ මාසික සභා රැස්වීම පසුගිය සතියේ පැවැත්වූ අතර එහි ප්‍රධාන මාතෘකාව ලෙස ගැනුණේ ප්‍රදේශය පුරා පැතිරී යන ඩෙංගු වසංගතය යි. එහි දී පැවැති සාකච්ඡාවෙන් කොටසක් පහත දැක්වේ.

''මේ වන විට අපේ ප්‍රදේශයේ රෝගීන් සියයකට වඩා රෝහල් ගත වී තිබෙනවා.''

''මාසයක් ඇතුළත එක් අයෙක් මැරුණා. දෙදෙනෙක් බේරා ගත්තේ දොස්තරවරුන්ගේ කැපවීම හින්දයි.අපි මේකට මැදිහත් වෙන්න ඕනේ.''

''අපට පුළුවන් මුළු ප්‍රදේශය පුරා ම ශ්‍රමදානයක් සංවිධානය කරන්න''

''ඔව් අන්‍යෝන්‍යාධාර සමිතියේ අයත් ඒවි.''

''පොලීසියත් සම්බන්ධ කර ගන්න ඕනේ.පන්සලේ නායක හාමුදුරුවන්ටත් මං මේ අදහස කිව්වා. අනිවාර්යයෙන් ම වඩිනවා කීවා.''

''සීයකට බනිසුයි කෙසෙල් ගෙඩියි තේයි දෙන්න මං පොරොන්දු වෙනවා.''

''හරි මම බත් පැකට් සියයක් ම දෙන්නම්''

''අපද්‍රව්‍ය, එකතු කරන්න බෑග් දෙසියකුත් අත් ආවරණත් මගෙ ගානේ.''

''එන අයට උදලු, කැති, තාච්චි හැකි තරම් ගේන්න කියමු. අඩුම ගානේ එක උපකරණයක්වත්.''

''මේ වැඩේ ප්‍රචාරය කරන්න ශබ්ද විකාශන යන්ත්‍රය අජිත් දෙන්නම් කිව්වා. මගේ වාහනයෙන් ඒ වැඩේ කරන්න පුළුවන්.''

''උදේ 8.00 ට පටන් ගනිමු. සවස 4.00 ට ඉවර කරමු.''

''ප්‍රදේශයේ ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂකතුමා අනිවාර්යයෙන් දවස ම වැඩේට කැප කරනවා කීවා. අපි එතුමා ආරම්භක අවස්ථාවට සම්බන්ධ කර ගනිමු.''

''දැන්වීම් පත්‍රිකාවක් නිර්මාණය කිරීම අපි ලේකම් මහත්මාට පවරමු. ඒක බෙදා හරින්න. හැමෝ ම උදව් කරන්න ඕනෑ.''

ඔබ 'විකසිත' යෞවන සමාජයේ ලේකම් කවිඳු අබේරත්න යැයි සිතා ඊට අදාළ දැන්වීම් පත්‍රිකාව පිළියෙල කරන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

නැතහොත්

යොවුන්ගම සරසවි විද්‍යාලයෙහි වාර්ෂික සාහිත්‍ය උත්සවය ලබන මස 15 වැනි දින විද්‍යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවැත්වීමට තීරණය කර ඇත. සංස්කෘතික අංග රැසක් ඇතුළත් මේ අගනා අවස්ථාවට කලාකරුවෝ සහ විද්වත්තු රැසක් සහභාගි වෙති. ඔබ මේ උත්සවය සංවිධානය කරන 'ඉඳුවර' සාහිත්‍ය සංසදයේ ලේකම්වරයා යැයි සිතා වැඩසටහනට අදාළ න්‍යාය පත්‍රය සකස් කරන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

ඉන්ටනෙට් සෙල්ලං

දිනක වේදෝ ලෙල්ලන්



නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න

Dialog

තිරසාරත්ව අංශයේ පණිවිඩයකි

G.C.E. ORDINARY LEVEL

අ.පො.ස. සාමාන්‍ය පෙළ

STUDENT SEMINAR SERIES - 2017

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

SINHALA LANGUAGE & LITERATURE

සිංහල භාෂාව හා සාහිත්‍යය

QUESTION PAPER - III

ප්‍රශ්න පත්‍රය - III



Powered by

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e පාඩම™ The National e-learning Portal for The General Education

සා/පෙළ සිත්මිණ

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉ-ඉගෙනුම් හා නැණසැස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය
අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017

සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය

11 ශ්‍රේණිය	සිංහල මාධ්‍යය	කාලය - පැ 2

උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
1, 2, 3, 4, ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
මෙම පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 80 කි.

01) (i) සිට (x) දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉරක් අදින්න.

(i) **"සොඳුර, මම යන්නට නොනිස්සෙමි."**

(අ) මෙහි 'සොඳුර' යනුවෙන් අමතන්නේ කාට ද?

(ආ) මේ ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.

(ii) **කැර මිණිබරණ රැස්**
රසින් සුර සැවූ සුවහස්

(අ) මේ කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මේ පද්‍ය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(iii) **"මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ "**

(අ) මෙහි දැක්වෙන ආරංචිය කුමක් ද?

(ආ) ඉහත කතා බහට සම්බන්ධ වූ දෙදෙනා කවුරුන් ද?

(iv) පහත දැක්වෙන කාව්‍ය ග්‍රන්ථ ලියූ රචකයන් නම් කරන්න.

(අ) සක්වාලිහිණි

(ආ) සුබ උදෑසන

(v) **"මේ රජ්ජුරුවෝ ඉතා මරණ භයින් භයපත්ව ගියාහ."**

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මේ පාඨය ඇතුළත් ග්‍රන්ථයට මූලාශ්‍රය වූ පාලි ග්‍රන්ථය නම් කරන්න.

(vi) **දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට**
රසෙයි අමා රසමය ඒ පියස දුට

(අ) මේ කාව්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය රචනා වූ සාහිත්‍ය යුගය සඳහන් කරන්න.

(ආ) මෙහි දැක්වෙන ගම් පියස හැඳින්වෙන නම කුමක් ද?

(vii) **"නොකරන් එලෙසා පියතුමගේ අණ ඉක්මවලා පුතුනේ"**

(අ) මේ පාඨයෙන් දැක්වෙන අවස්ථාව කුමක් ද?

(ආ) මේ පාඨය සහිත සාහිත්‍ය කෘතිය අයත්වන සාහිත්‍යාංගය කවර නමින් හැඳින්වේ ද?

(viii) **"දැන් නම් හරි ඩාදිය අක්කෙ, හවසට අඹරමු."**

(අ) මේ පාඨය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) 'හවසට අඹරමු' යන්නෙන් කවර ද්‍රව්‍යයක් අදහස් වේ ද?

(ix) **නල <u>බල</u> සසල දළ රළ පෙළ නුබ නැගෙන**
<u>බල</u> මහ මුහුදු එම සඳ උතුරෙන් පෙනෙන

(අ) මෙහි යෙදී ඇති 'බල' යන පදයේ අර්ථ දෙක වෙන වෙන ම දක්වන්න.

(ආ) මේ කාව්‍ය ග්‍රන්ථය ලියූ කතුවරයාගේ නම කුමක් ද?

(x) පහත දැක්වෙන කතුවරුන් ලියූ ග්‍රන්ථයක් බැගින් නම් කරන්න.

(අ) ගුරුළුගෝමීන්

(ආ) ධර්මසේන හිමි

(ලකුණු 2 x 10 = 20 යි.)

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "බෝධිසත්වයන් වහන්සේ එදවස උදැසන සොළොස් කළයක් සුවඳ පැනින් ඉස් සෝධා නහා ලක්ෂයක් අගනා කසී සළුවක් හැඳ සර්වාභරණයෙන් විභූෂිත වැ නොයෙක් රසයෙන් අග්‍ර වූ අමරා දේවීන් විසින් පිසින ලද භෝජනය අනුභව කොට මහත් පෙරහරින් වාසල් දොරකඩට ගොස්"

(අ) මෙම පාඨය කුමන අවස්ථාවක් හා සම්බන්ධ වේ ද?

(ආ) වාසල් දොරකඩට එන්නට පෙර ගමනට සූදානම් වීම කියාපාන කරුණු දෙකක් ලියන්න.

(ii) ගනේ මිණි බැබළි කිරණෙව් **<u>සතපාය</u>**
රනේ **<u>යට'ග</u>** සැවුලිඳු දද ගලපාය
අනේ ලකර කළ පුර අප නරපාය
පෙනේ දකුණැ මහසෙන් දෙව්රද පාය

(අ) මහසෙන් දේවාලයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(iii) "පුංචි මැණිකාගේ කලබල නැති ගතියත්, සාන්ත බව හා යටහත් පහත් ගතියත් නිසා කවුරුත් ඇ ප්‍රිය කළහ. පුංචිරාල පවා කිවේ පුංචි මැණිකා මුවැත්තියක් වගේ'යි කියා ය. පිස්සු වැද්දා කොටියෙකැයි කියන්නට පුරුදු වී සිටි ගම්මු පුංචි මැණිකා ගැන කීවේ කොටියාගේ පැටියා මුවෙක් වෙලා කියා ය."

(අ) පුංචි මැණිකා කෙරෙහි දක්නට ලැබෙන විශේෂ ගුණාංග දෙකක් නම් කරන්න.

(ආ) "කොටියාගේ පැටියා මුවෙක් වෙලා" යන්නෙහි අදහස කුමක් ද?

(iv) කඳු බෑවුමක දං බෝවිටි පඳුරු සලා
පහළට ඇදී පරමල් පෙති ඉවත නොලා
<u>කලදෝ</u> දියෙන් පොහවා රන් **<u>පුලිනතලා</u>**
සංගීතවත් වී යමි ඉදිරියට ගලා

(අ) මුල් පද දෙකෙන් දැක්වෙන පරිදි ගඟ ස්වාභාවිකව ගලා යන අයුරු සඳහන් කරන්න.

(ආ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(v) "මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නො වෙයි. තමා ජාති සම්පන්න නො වන හෙයින් ජාතියක් නිසාත් නො වෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය."

(අ) මෙහි දැක්වෙන තැනැත්තිය කෙරෙහි අභිමානය ඇති නොවීමට හා ඇති වීමට හේතු වේ යැයි කියැවෙන කරුණු බැගින් ලියන්න.

(ආ) මෙය කවර අවස්ථාවක් හා සම්බන්ධ වේ ද?

(ලකුණු 4 x 5 = 20)

03) උම්මග්ග ජාතක කථාකරුවා එක් එක් පුද්ගලයා කෙරෙහි දක්නට ලැබෙන,

(i) මානව හිතවාදී චර්යාවන් ද

(ii) හිංසාකාරී ගති ලක්ෂණ ද

සිත් ගන්නා පරිදි ගෙනහැර පායි' උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

නැතහොත්

එක ම තැනැත්තකු අවස්ථා දෙකක දී වෙනස්ව හැසිරෙන ආකාරය,

(i) අංගුලිමාල සොරු හා

(ii) අංගුලිමාල තෙරුන්ගේ

චරිත මගින් පිළිබිඹු වෙයි. නිර්දිෂ්ට පාඩම ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දෙමින් මේ අදහස විස්තර කරන්න.

(ලකුණු 15 යි)

04) සිංහබාහු නාට්‍යය මගින් ඉදිරිපත් කෙරෙන්නේ ,

(i) මවුපියන් තුළ දරුවන් කෙරෙහි වන අසීමිත දාරක ස්නේහයත්

(ii) නව්‍යමය දිවි පෙවතක් වෙනුවෙන් දරුවන් තුළ පවත්නා අපේක්ෂාත්

අතර ඇති අරගලය යි. සුදුසු උදාහරණ දෙක බැගින් දෙමින් මේ අදහස පැහැදිලි කරන්න.

නැතහොත්

කෑරගල වෙහෙර වැනුම කියවන රසිකයා ඇතුළු වන්නේ ,

(i) සශ්‍රීකත්වයෙන් ද (i) සුන්දරත්වයෙන් ද

පිරි රමණීය පරිසරයකට ය. එක් එක් කරුණ සඳහා උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

5,6 හා 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

05) අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී බැද්දේගම කතුවරයා දක්වන සාමර්ථ්‍යය උදාහරණ තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

06) වස්සානය කාව්‍ය නිර්මාණය චමත්කාරජනක පරිසර වර්ණනයකි. උදාහරණ තුනක් මගින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

07) උදාහරණ ගෙනහැර පාමින් අපූරු ආකාරයකට උපදෙස් දෙන්නට ජනකවියා තුළ වූ නිසර්ග හැකියාව "හානා භීය පානා අඩහැරෙන් දැනේ" කවි පෙළෙන් නිරූපිත ය. නිදසුන් තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 10 යි)


ඉන්ටනෙට්
සෙල්ලං
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට
වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි